රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 03/92

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1992 ජනවාරි මස 25 වෙනි දින.

සියළුම : අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා මහ ලේකම්වරුන්,
පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිසාපතිවරුන් වෙත.

## <u>රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යාල වේලාවන් හා නිවාඩු</u>

1980 අප්‍රේල් 01 දින අංක. 162 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට ඔබේ අවධානය යොමු කරවමි. එකී චක්‍රලේඛයේ 06 ජේදයේ (1) සහ (IV) වගන්තිය මෙයින් අවලංගු කරනු ලැබේ.

02. කාර්යාලයට ප්‍රමාද වී පැමිණීම සම්බන්ධයෙන් පහත සඳහන් නියමයන් වහාම ක්‍රියාත්මක වන පරිදි අදාල කර ගන්න.

(I) පෙ.ව.8.30 ත් පෙ.ව.9.00 ත් අතර ඕනෑම වේලාවක කාර්යාලයට පැමිණෙන නිලධාරියෙකුට එසේ ප්‍රමාදවන කාලය ප.ව.4.15 න් පසුව වැඩ කර ආවරණය කිරීමට ඉඩ දෙනු ලැබේ. (ප.ව.4.45 තෙක් පමණි.)

(II) පෙ.ව.8.00 ත් පෙ.ව.8.15 ත් අතර කාර්යාලයට පැමිණෙන සුළු සේවකයින්, එසේ ප්‍රමාද වූ කාලය ප.ව.4.45 න් පසුව ආවරණය කිරීමට ඉඩදෙනු ලැබේ. (ප.ව.5.00 වනතෙක්)

(III) රාජ්‍ය නිලධාරිණියකට ගර්භනී අවස්ථාව මාස 05 ක් වූ පසු, රාජකාරි සඳහා සේවා ස්ථානයට පැය භාගයක් ප්‍රමාද වී පැමිණීමට ද, සාමාන්‍යයෙන් සේවා ස්ථානයෙන් පිටවන වේලාවට පැය භාගයකට ප්‍රථම පිටවීමට ද ඉඩ දෙනු ලැබේ. මෙම අනුග්‍රහය දෙනු ලබන්නේ නිලධාරිණිය ප්‍රසූති නිවාඩු ලබා ගන්නා තෙක් පමණි.

03. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

අ.කලේ/ (ආර්.අබේරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.